කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක : 27

මගේ අංකය: ඩීඑම්එස්/වැටුප් /පොදු,
කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව,
මහා භාණ්ඩාගාරය,
කොළඹ 01.

2006.01. 17

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්, රාජ්‍ය සංස්ථා,
ව්‍යවස්ථාපිත මණ්ඩල සහ සම්පූර්ණයෙන් රජය සතු
සමාගම් සභාපතිවරුන් වෙත.

## රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල, සහ සම්පූර්ණයෙන් <u>රජය සතු සමාගම්වල සේවක වැටුප් ප්‍රතිශෝධනය කිරීම</u>

2006 ජනවාරි 12 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2006 මගින් 2006 අයවැය යෝජනා අනුව 2006.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි රජයේ සේවකයන් සඳහා නව වැටුප් ව්‍යුහයක් හඳුන්වා දී ඇත. ඊට අනුකූලව විශ්ව විද්‍යාල ඇතුළු රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ සම්පූර්ණයෙන් රජය සතු සමාගම් සඳහා නව වැටුප් ව්‍යුහයන් හඳුන්වාදීමට පරිපාලනය සඳහා වන ජාතික සභාව දැනටමත් කටයුතු කරගෙන යනු ලැබේ. එම සභාව විසින් නිර්දේශ කරනු ලබන නව වැටුප් ව්‍යුහයන් ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් උපදෙස් පසුව නිකුත් කරනු ලැබේ.

**02. එසේ 2004.12.28 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 25 අනුව වැටුප් ප්‍රතිශෝධනය සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ඇති ආයතන, සිය ආයතනය සඳහා අනුමත කරන ලද ප්‍රතිශෝධිත වැටුපෙහි 2006.01.01 දිනට වැඩිවීමට නියමිත ඉතිරි 50% වැටුප් වැඩිවීමට අදාල මුදල් ප්‍රමාණය එදින සිට බලපැවැත්වෙන සේ අත්තිකාරම් මුදලක් ලෙස ගෙවීමට ක්‍රියාකළ යුතු ය.**

03. කිසියම් ආයතනයක් කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 25 පරිදි විධිමත් අනුමැතියක් ලබා නොගෙන වැටුප් ප්‍රතිශෝධනයක් සිදුකර ඇත්නම් එම ආයතන 2006.01.01 දින සිට බල පැවැත්වෙන සේ වැටුප් ප්‍රතිශෝධනයක් ක්‍රියාත්මක නොකළ යුතුය. එවැනි ආයතන පූර්ව අනුමැතිය ලබා නොගැනීමට හේතුද පැහැදිලි කරමින් විධිමත් ඉල්ලීමක් අමාත්‍යාංශ ලේකම්වරයාගේ නිර්දේශය සහිතව පරිපාලනය සඳහා වන ජාතික සභාවට ද පිටපතක් සහිතව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු ය.

04. ජීවන වියදම් දර්ශකයට අනුව විචලා ජීවන වියදම් දීමනාවක් හෝ ඒ හා සමාන දීමනාවක් නොගෙවන රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ සම්පූර්ණයෙන් රජය සතු සමාගම් වල සේවකයන් සඳහා 2006.01.01 දින සිට බලපැවැත්වෙන සේ, රු.1000/- (දහසක) මාසික ජීවන වියදම් දීමනාවක් ගෙවනු ලැබේ. ජීවන වියදම් දර්ශකයේ වෙනස්වීම අනුව සෑම මාස 06 ක් අවසානයේ එනම් සෑම වර්ෂයකම ජූනි 30 හා දෙසැම්බර් 31 අවසානයේදී ඒකකයට රු.2.50 බැගින් මෙම දීමනාවෙහි ගැලපීම් සිදු කරනු ලැබේ.

05. එසේම රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ සම්පූර්ණයෙන් රජය සතු සමාගම් වල සේවකයන් සඳහා දැනට ගෙවනු ලබන දිරි දීමනා, වාර්ෂික දීමනා ඇතුළු සියලුම දීමනා පරිපාලනය සඳහා වන ජාතික සභාව විමසමින් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් නැවත තීරණය කොට අදාල ආයතන වලට දැන්වීමට කටයුතු කරනු ලැබේ.

06. පහත සඳහන් රාජ්‍ය ව්‍යාපාර ආයතනයන් සඳහා නව වැටුප් වැඩිවීම අදාල නොවේ.

i. පාරිභෝගික මිල දර්ශකයට සම්බන්ධ කර ගත් ජීවන වියදම් දීමනාවක් ගෙවනු ලබන රාජ්‍ය ව්‍යාපාර

ii. වෘත්තීය සංගම් හෝ සේවකයන් සමග එළඹ ඇති සාමූහික ගිවිසුම් වලින් ආවරණය වන්නාවූ රාජ්‍ය ව්‍යාපාර

iii. බැංකු හා මූල්‍ය ආයතන

iv. ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය හා ප්‍රාදේශීය පොකුරු බස් සමාගම් හැර අනෙකුත් උපාය මාර්ගික රාජ්‍ය ව්‍යවසාය ලෙස හඳුනාගත් ආයතන (ඇමුණුම 1 බලන්න)

v. භාණ්ඩාගාරය විසින් හෝ අමාත්‍ය මණ්ඩලය විසින් හෝ අනුමත කරන ලද විශේෂිත වැටුප් ක්‍රම පවතින රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල සහ සම්පූර්ණයෙන් රජය සතු සමාගම්

එස්.බී.දිවාරත්න
භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්.

පිටපත්:
1. ජනාධිපති ලේකම්
2. අග්‍රාමාත්‍ය ලේකම්
3. විගණකාධිපති.

## උපාය මාර්ගික රාජ්‍ය ව්‍යවසායන්:

I. ලංකා බැංකුව
II. මහජන බැංකුව
III. ජාතික ඉතිරිකිරීමේ බැංකුව
IV. රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව
V. ශ්‍රී ලංකා විදුලිබල මණ්ඩලය
VI. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව
VII. ශ්‍රී ලංකා වරාය අධිකාරිය
VIII. ගුවන් තොටුපල හා ගුවන් සේවා (ශ්‍රී ලංකා) සමාගම
IX. ශ්‍රී ලංකා දුම්රිය සේවය
X. ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය හා ප්‍රාදේශීය පොකුරු බස් සමාගම්
XI. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය
XII. රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව